# ඇමෙරිකානු තානාපති කාර්යාලය, කොළඹ

## බිම් නඩත්තු අධීක්ෂක (කාන්තා / පුරුෂ)

**කොළඹ පිහිටි ඇමෙරිකානු තානාපති කාර්යාලය විසින් පහසුකම් කළමනාකරණ කාර්යාලයේ පවතින බිම් නඩත්තු අධීක්ෂක තනතුර සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන් / කාරිණියන් බඳවා ගැනේ.**

**කාන්තා සහ පුරුෂ දෙපාර්ශවයම මෙම තනතුර සඳහා අයදුම් කරනු ඇතැයි අපේක්ෂා කරමු.**
**ඇමෙරිකානු තානාපති කාර්යාලය ජාතිය, වර්ණය, ආගම, ලිංග භේදය, ජාතිකත්ව සම්භවය, වයස, ආබාධිතභාවය, දේශපාලන පක්ෂපාතිත්වය, විවාහක / අවිවාහක බව හෝ ලිංගිකත්ව අභිමතය යන කරුණු නොසලකන අතර මානව විවිධත්ව ශ්‍රම බලකායක් යටතේ සමාන අවස්ථා වෙනුවෙන් කටයුතු කරනු ලබයි.**

අලුතින් සේවයට බඳවාගනු ලබන තැනැත්තා / තැනැත්තිය නේවාසික පරිශ්‍ර ඉංජිනේරු යටතේ සෘජුවම සේවය කරන අතර උද්‍යාන පාලකවරුන් හයදෙනෙක් (6) සහ පිහිනුම් තටාක සහයකයින් දෙදෙනෙක් (2) අධීක්ෂණය කළ යුතු වේ. තානාපති නිල නිවස, නියෝජ්‍ය තානාපති නිල නිවස, විනෝද මධ්‍යස්ථානය මෙන්ම තානාපති කාර්යාලය විසින් කුලී පදනම යටතේ ලබාගෙන ඇති නේවාසික ගොඩනැගිලි වල භූමි නඩත්තුව මෙම අංශයට පැවරී ඇති වගකීමක් වේ. මෙම තනතුර දරන්නා විසින් තානාපති කාර්යාලයට අයත් නිල නිවෙස් වල නඩත්තු කටයුතු සිදු කිරීමට අමතරව එහි උද්‍යාන, තණ පිට්ටනි සහ අනෙකුත් බාහිර අවකාශ වල පෙනුම වැඩිදියුණු කිරීම සඳහා අලංකරණ කටයුතු වලද යෙදිය යුතුය. ඔහු / ඇය ආරක්ෂාකාරී මෙන්ම ඵලදායී ලෙසද කටයුතු කළ යුතු අතර මෙම නිල නිවාස වල මීයන්, කෘමීන් ඇතුලු පළිබෝධයන් මර්දනය පිළිබඳ වගබලාගත යුතුය.

**පූර්ණ කාලීනව සතියකට පැය 40 ක සේවා කාලයක් සහිත මෙම තනතුර සඳහා මාසික දළ වැටුප රු. 92,826/- කි.**

### අවශ්‍ය සුදුසුකම් :

1 **අධ්‍යාපනය** - අ.පො.ස. සාමාන්‍ය පෙළින් අනතුරුව (අඛණ්ඩව හෝ කොටස් වශයෙන්) වසරක (1) වෘත්තීය පුහුණුවක් හෝ ආධුනිකත්ව පුහුණුවක් භූ නිර්මාණ/උද්‍යාන පාලන/බිම් සැකසීම් හෝ ඊට අනුබද්ධ ක්ෂේත්‍රයන් යටතේ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු ආයතනයේ හෝ අධ්‍යාපන අමාත්‍යාංශයේ ලියාපදිංචි අධ්‍යාපන ආයතනයක සම්පූර්ණ කර තිබිය යුතුය.
**(අදාළ අධ්‍යාපන සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය).**

2 **පූර්ව රැකියා පළපුරුද්ද** - භූ නිර්මාණ/උද්‍යාන පාලන/බිම් සැකසීම් හෝ ඊට අනුබද්ධ ක්ෂේත්‍රයක අවම වශයෙන් වසර පහක (5) පුහුණු ශිල්පී මට්ටමේ සේවා පළපුරුද්දක් තිබිය යුතුය. එම කාලය අතරතුර අවම වශයෙන් වසරක (1) අධීක්ෂක මට්ටමේ පළපුරුද්දක්ද තිබිය යුතුය. **(අදාළ සේවා / ආයතනයේ පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය).**

3 **භාෂා ප්‍රවීණතාවය** - III වන මට්ටමේ (මනා කාර්යස්ථ දැනුම) ඉංග්‍රීසි භාෂාව කියවීම, ලිවීම සහ කථා කිරීමේ නිපුණතාවය අවශ්‍ය වේ **(මෙය පරීක්ෂා කරනු ලැබේ)**.
එසේම III වන මට්ටමේ (මනා කාර්යස්ථ දැනුම) සිංහල සහ / හෝ දෙමළ කියවීම, ලිවීම සහ කථා කිරීමේ නිපුණතාවය අවශ්‍ය වේ.

4 **නිපුණතා සහ හැකියාවන්** - අධීක්ෂණයට ලක්වන සේවකයින්ට අනුගමනය කිරීම සඳහා උද්‍යාන, තණබිම් සහ අනෙකුත් බාහිර අවකාශ නඩත්තු කිරීම පිළිබඳ නිශ්චිත ක්‍රමවේදයන් සකස් කිරීමට ද, නඩත්තු කාලසටහන් සහ පුහුණු වැඩසටහන් සකස් කිරීමටද හැකියාව තිබිය යුතුය. මෙම අවකාශයන් ඉහළ මට්ටමේ රාජ්‍යතාන්ත්‍රික උත්සව පැවැත්වීමට යොදාගන්නා බැවින් ඒවා ආරක්ෂාකාරීවත්, වල් පැළෑටි සහ පළිබෝධයන්ගෙන් තොරවත්, තානාපති කාර්යාලය පිළිබඳ සුභවාදී ආකල්පයක් ඇතිවන ලෙසත් නඩත්තු කිරීමට හැකියාව හැකියාව තිබිය යුතුය. බඳවා ගන්නා තැනැත්තා / තැනැත්තිය විසින් ඉංග්‍රීසි භාෂාවෙන් වාර්තා සැකසීම සහ තොරතුරු හුවමාරු කිරීම සිදුකල යුතුයි. අතින් සහ විදුලියෙන් ක්‍රියාකරන තණකොල කැපීමේ යන්ත්‍ර, කප්පාදු කිරීමේ උපකරණ, කියත්, වල් පැළෑටි ඉවත් කිරීමේ උපකරණ ඇතුළු අදාළ බල මෙවලම් භාවිතා කිරීමේ හැකියාව තිබිය යුතුය. මනා රිය ධාවන වාර්තාවක් සහිතව **"B"** පන්තියේ වලංගු රියදුරු බලපත්‍රයක් (කලින් 'C','C1' කාණ්ඩ) තිබිය යුතු වේ. **(සුරක්ෂිතව රිය පැදවීමේ හැකියාව පරීක්ෂා කෙරෙනු ඇත) රියදුරු බලපත්‍රයේ පිටපතක් අමුණා එවිය යුතුය.**

### අයදුම් කරන ආකාරය :

ඔබගේ අයදුම්පත ඉලෙක්ට්‍රොනික බඳවාගැනීමේ යෙදවුම් පද්ධතිය **[ERA]** හරහා ඉදිරිපත් කිරීම සඳහා කරුණාකර අපගේ වෙබ් අඩවිය වන **https://lk.usembassy.gov/embassy/jobs/** වෙත පිවිසෙන්න. ඔබ විසින් අදාළ අයදුම්පත් ඉදිරිපත් කිරීමට පෙර අපගේ වෙබ් අඩවියේ සඳහන් කර ඇති උපදෙස් පරීක්ෂාකාරීව කියවනු ඇතැයි අපේක්ෂා කෙරේ.

### අවශ්‍ය ලේඛන :

මෙම තනතුර සඳහා අයදුම් කිරීමට, අයදුම්කරුවන් විසින් **විද්‍යුත් අයදුම්පත සමඟ පහත ලේඛනවල විද්‍යුත් පිටපත් ඉදිරිපත් කළ යුතු ය**. එසේ කිරීමට අපොහොසත් වන අයදුම්කරුවන් මෙම රැකියා අවස්ථාව සඳහා සුදුස්සන් නොවන බවට සලකනු ලැබේ.

- අදාල අධ්‍යාපන සහතික
- අදාල සේවා / කාර්යය පළපුරුද්ද පිළිබඳ සහතික
- රියදුරු බලපත්‍රය (පැති දෙකම සහිත)
- පුරවැසිභාවය සනාථ කිරීමේ ලියවිලි (ජාතික හැඳුනුම් පත / විදේශ ගමන් බලපත්‍රය සහ/හෝ වැඩ බලපත්‍ර)

**තැපැල් හෝ විද්‍යුත් මාධ්‍ය මගින් එවනු ලබන අයදුම්පත් භාරගනු නොලැබේ.**

ඔබගේ අයදුම්පත 2021 **අගෝස්තු** 04 වන දින හෝ ඊට පෙර අප වෙත ලැබෙන්නට සලස්වන්න.
තෝරාගනු ලබන අයදුම්කරුවන් පමණක් කැඳවන බව කාරුණිකව සළකන්න.